# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2047/49 – 2017 නොවැම්බර් 30 වැනි බ්‍රහස්පතින්දා – 2017.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලවත්ත (වැල්ලවත්ත දකුණ කොට්ඨාස අංක 40, කොළඹ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක සීඕ/ටීඑච්අයි/2016/349 හා 2017.03.30 දිනැති ප්‍රමාණයෙන් හෙක්. 1.2858 ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අංක 1 – වරි. අංක සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 1.2858 ක් පමණ**

උතුරට: හමාස් පාර සහ ගාලු පාර; නැගෙනහිරට: ගාලු පාර, ගාලුපාරේ වරි. අංක 176, නෙල්සන් පෙදෙසේ වරි. අංක සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම, නෙල්සන් පෙදෙසේ වරි. අංක 14, 16. 16ඒ, 22/1, 24/1, 26 සහ 28 දරණ ඉඩම්; දකුණට: ගාලු පාර, වරි. අංක 176, නෙල්සන් පෙදෙසේ වරි. අංක සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම, නෙල්සන් පෙදෙසේ වරි. අංක 14, 16. 16ඒ, 22/1, 24/1, 26 සහ 28 දරණ ඉඩම; බටහිරට: නෙල්සන් පෙදෙසේ වරි. අංක සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම, හමාස් පාරේ වරි. අංක සොයාගත නොහැකි එස්. වර්ණකුලසූරිය හිමිකම් කියන ඉඩම.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2015/එල්ඕ/327.
2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 - 516

1A – G26722 – 12 (2017/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*